





24 වන පිටෙන්

ලිපි ලියන්න පටන් ගත්ත. මම ඉරනම පත්තරේටත් ලිපි ලියල තියනවා "සිගරට්ටුවක් කතාකරයි'' කියලා. මම නිතර පත්තර කන්තෝරු වලටත් යන්න එන්න ගත්තා. මේ හේතුවෙන් හැම පත්තර කාර්යාලයකම මට මිතුරන් ඇතිවුණා. ඒ කාලේ හිටපු ජ්‍යෂ්ඨ මාධ්‍යවේදීන් සියලුම දෙනා මම අඳුනනවා.
විශ්වවිද්‍යාලයේ අවසාන වර්ෂයේදී මම තෝරාගන්නවා නිබන්ධනයක් ලියන්න. මෙයට මාතෘකාව වුණේ ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ උපත හා වර්ධනය. මේ සඳහා උපදෙස් ලබාගන්න මම තෝරා ගත්තා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කුමාරි ජයවර්ධන .මේ ඇසුරින් ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ පුරෝගාමීන් සියලු දෙනාම මම හඳුනාගත්තා.

මම විශ්ව විද්‍යාලයෙන් පිටව යන කාලේ පැවැති සිරිමා බණ්ඩාරනායක රජය පෙරලුනා. බලයට පැමිණියේ ජේ ආර් ජයවර්ධන රජය. මේ හේතුව නිසා මට විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය තනතුරක් ලැබෙන්නේ නෑ. මට රස්සාවක් නැතුව ඉන්න ගමන් කොළඹට ඇවිල්ලා පත්තර වලට ලියන්න පටන් ගත්තා. මේ වෙලාවෙ මට සම්බන්ධ වෙන්න පුළුවන් වුණා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් පටන් ගත්ත "දෙසතිය'' සඟරාවට. මේක කළේ සරත් අමුණුගම මහත්මයා. මේ අතරේ දෙසතිය සඟරාවෙන් මට කිව්වා ඒ කාලේ ප්‍රහලම ඇමතිවරයෙක් හැටියට හිටපු ගාමිණී දිසානායක මහත්මයා හමුවෙලා ලිපියක් ලියන්න කියලා. ගාමිණී දිසානායක මහත්ම යා ගැන හොඳට කියවලා බලලා එතුමා මුණ ගැහෙන්න ගියා. එතුමා මගෙන් ඇහුවා බව මහවැලි ව්‍යාපාරය ගැන මොනවද කියන්නෙ කියලා. මම කිව්වා මහවැලි ව්‍යාපාරයට ලංකාවේ දෙවෙනි කැරැල්ල ඇතිවීම වළක්වන්න බෑ කියලා. පස්සේ මේ ගැන දිගින් දිගට ම එතුමා මාත් එක්ක කතා කළා. පස්සේ එතුමා ගැන මම ලිපියකුත් ලිව්වා. එතුමා මට කතා කරලා කිව්වා ඔබට මම මහවැලි ව්‍යාපාරයේ රැකියාවක් දෙන්න සූදානම්. මම කිව්වා මට එය ගන්න බෑ කියලා. ඊට පස්සේ කිව්වා මම ඔයාට අපේ අමාත්‍යාංශයෙන් දීමනාවක් ගෙවනවා ඔබ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ඉඩ තියෙන වෙලාවට කරන්න කියලා. මම කිව්වා බොහොම ස්තූතියි සර් ඒකත් මට එපා, ඔබතුමාට පුළුවන්නං මාව විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙක් සඳහා තෝරාගැනීමට සම්මුඛ පරීක්ෂණයකට ආවස්තාවක් උදාකර දෙන්න කියලා. ඒවගේම මාව ගන්න කියලා බල කරන්නත් එපා ඒ සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වුනොත් මට ඒ රැකියාව ලැබෙයි කියලා. ඒ වන විට විශ්ව විද්‍යාලයේ ඇබෑර්තු වගයකුත් තිබුන. ඒ අනුව පරීක්ෂණය සමත් වෙලා මට විශ්වවිද්‍යාලයේ තාවකාලික කථිකාචාර්ය පදවියක් ලැබුණා. මේ අතරෙ මට ලැබුණා පශ්චාත් උපාධිය සඳහා ජන සන්නිවේදනය පිළිබඳ පර්යේෂණයක් කරන්න. ඒකත් මම හරිහැටි කරලා මට අවස්ථාවක් ලැබුණා රුසියාවට යන්න. එහේ ගිහින් මම ඉතා වෙහෙසකාරී විදියට ඉගෙන ගත්තා. ඒ අතරේ මට නොයෙකුත් රටවල් වල සංචාරය කරන්න ලැබුණා . ජීවිතයට නොයෙකුත් අත්දැකීම් එකතු වුණා. එහෙදි මම ලංකාවේ නිදහස් ව්‍යාපාරයේ පුවත්පත් සම්බන්ධව ආචාර්ය උපාධිය කළා. මම ලංකාවට ආවට පස්සේ ගුවන් විදුලිය තුළ රූපවාහිනිය තුළ පුවත්පත් තුළ නමක් හදාගෙන හිටියා. විශ්වවිද්‍යාලයේ ආචාර්ය වරයෙක් හැටියට වැඩ කරන ගමන් ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂක වරයෙක් ලෙස ට රූපවාහිනියේ අධ්‍යක්ෂ මණ්ඩලයට පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ආදී වශයෙන් විවිධ රාජ්‍යආයතන වල ජූරි සභාවල නොයෙකුත් තනතුරු මට ලැබුණා. ඒ අතරේ පතපොත ලිව්වා ශාස්ත්‍රීය කටයුතුවල නියැලුණා.

**සන්නස** එතකොට ඔබ දේශපාලන කටයුතු වලට සම්බන්ධ වුණේ

**මහාචාර්යතුමා** මම ඒ දවස් වල මහවැලි ජනපද සම්බන්ධව පොතක් ලිව්වා. එය දොරට වැඩීමේ අවස්ථාවට මම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ආරාධනා කළා. ඒ දවස් වල එතුමා මහවැලි නියෝජ්‍ය ඇමැති. එදා මෙතුමා මාව හොඳින් අඳුනගත්තා. අවුරුදු 35ක විතර විශ්ව විද්‍යාල සහ අනෙකුත් සේවා කටයුතුවල නියැළිලා විශ්ව විද්‍යාලයෙන් ඉවත් වුණු පසු මට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කතා කරලා කිව්වා ඔබ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් තනතුර භාර ගත යුතුය කියලා. ඒ විදියට තමයි මම දේශපාලනයට ආවේ

**සන්නස** වර්තමාන තත්වය ගැන ඔබතුමා ගෙන් විමසුවොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබලයෝ ගෝඨාභය මැතිතුමාට සහාය දක්වන බව කියනවා. ඒ අනුව ඉදිරියේදී තවත් කණ්ඩායමක් පොදුජන එක්සත් පෙරමුණ වෙත පැමිණෙන බවත් කියනවා. එහෙම උනොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අනාගතයක් තිබේද?

**මහාචාර්යතුමා** මේ සම්බන්ධව අපි අපේ වර්තමාන කොටස් ඔක්කොම සමඟ සාකච්ඡා කළා. එහිදී සියලුම දෙනා එකඟ වුණා අපි එකම අදහසක ඉන්නවා කියලා වෙන වෙනම පුද්ගලික වශයෙන් පොදුජන එක්සත් පෙරමුණ සහයෝගය දෙන්නට යන්නේ නැහැ . ඒක නිසා ඔය බෙදීම වෙන්නේ නෑ.

**සන්නස** ලකුණ ගැටලුවක් කර ගන්නේ නැතුව දෙගොල්ලන්ට එකතු වෙන්න බැරිද?

**මහාචාර්යතුමා** පසුගිය පළාත් පාලන මැතිවරණයෙදී අපි අපේ පාක්ෂිකයින්ට කිව්වේ අත ලකුණට ඡන්දය දෙන්න කියලා. ඉතින් නැවතත් ඒ දවස්වල අපට විරුද්ධ පක්ෂයක් හැටියට හිටපු පොහොට්ටුව ලකුණට ඡන්දෙ දෙන්න කියලා අපි පාක්ෂිකයින් කොහොමද මෙහෙයවන්නේ. ඒක නිසා වඩාත්ම සුදුසු දෙය කාටත් පොදු වෙනත් ලකුණකට පැමිණෙන එකයි කියලා මා හිතනවා. කෙසේ වෙතත් අප හැම දෙනාගේම පොදු මතය වෙලා තියෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ රජයක් බිහිවෙන ආකාරයට කිසිදු වැඩපිළිවෙළක් නොකිරීමටයි.

**සන්නස** පසුගිය කාලවල ඔබතුමා සහ කණ්ඩායමක් ප්‍රබල ජනමත විචාරණයක යෙදෙමින් ඡන්ද ප්‍රතිඵල ඉතාමත්ම නිවැරදිව කල් වේලා ඇතිව සොයාගත්තා මෙවර එවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවාද

**මහාචාර්යතුමා** ඒවාගේ ව්‍යාපෘතියකට ලොකු මුදලක් වැය කරන්න සිද්ධ වෙනවා. මේ අවස්ථාවෙත් කීපදෙනෙක් අපිට මුදල් ලබා දෙන්නට කැමැත්ත පළ කරලා තියෙනවා. එහෙම පුළුවන්කමක් ලැබුණොත් මෙවරත් එම ජනමත විචාරණය කරන්නයි බලාපොරොත්තුව

**සන්නස** ඉතාමත් කාර්යබහුල ජීවිතයක් ගතකරන ඔබතුමා සන්නස පුවත්පතට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධව මා බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම පසුගිය කාලය පුරා ඔබ අපේ රටට කරන ලද සේවය ඉදිරියටත් කිරීමට ඔබතුමාට නිරෝගී සම්පත්තිය සහ දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා. ආයුබෝවන්